කොවිඩ්-19 ආසාදිතයින් රෝගීන් ලෙසින් මිස රෝගය අනෙක් අයට පතුරුවන්නවුන් ලෙසින් හැඳින්වීමෙන් වළකින මෙන් කොවිඩ්-19 වාර්තාකරණය සඳහා සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් නිකුත් කොට ඇති නිර්දේශයන්හි දැක්වේ. යම් අයෙකුට කොවිඩ්-19 වැළඳීම එම පුද්ගලයාගේ වරදක් නොවේ. කෙසේ නමුත් කොවිඩ්-19 රෝගීන් වෙත රෝගය ව්‍යාප්ත වීම කෙරෙහි දෝෂදර්ශනය කරන ආකාරයේ වාර්තාකරණයන් ඔස්සේ, කොවිඩ්-19 රෝගීන් හා ආසාදිතයින් සම්බන්ධයෙන් දිගින් දිගටම සමාජය තුළ ගර්හාවක් හා කොන් කිරීමේ ආකල්පයක් ඇති වනු ඇත. එය කොවිඩ්-19 මර්දන කටයුතු වලටද බාධාවක් වනු ඇත.

මෙසේ බලන විට, පහත දිවයින පුවත් වාර්තාව ඉහත කියූ මාධ්‍ය නිර්දේශයන්ට අනුකූල යැයි ඔබ සිතන්නේද? එය ආචාර ධර්ම උල්ලංඝනය කරනා වාර්තාකරණයක් නොවන්නේද?

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #SinhalaNews #SundayDivaina**